මහවැලි කෘෂිකර්ම වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

<u>මහජනයාගේ දැනගැනීම සඳහා</u>

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් කළමනාකරණය කරන ප්‍රදේශ තුළ සූර්ය විදුලි බල ශක්තිය උත්පාදනය කිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනාගෙන ඇත. ලංකා විදුලි බල මණ්ඩලය මඟින් සූර්ය විදුලි බල උත්පාදනය සඳහා ආයෝජකයන් තෝරා ගැනීමට මිළ ගණන් කැඳවන අවස්ථාවේදී මෙම ඉඩම් ද ආයෝජකයින් හට ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කිරීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය කටයුතු යොදා ඇත. මෙම් ඉඩම් පිහිටා ඇත්තේ වැලිකන්ද, පොළොන්නරුව, ඇඹිලිපිටිය, දෙහිඅත්තකණ්ඩිය, හම්බන්තොට යන ප්‍රදේශයන් ආශ්‍රිතවය.

මෙම ඉඩම් පරිහරණ ගාස්තුව ලෙස ආයෝජකයින් විසින් ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය වෙතින් ලබාගන්නා මුළු මුදලින් 6% ක මුදලක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ගෙවිය යුතුය. මෙම ඉඩම් පරිහරණය සූර්ය විදුලි බලය උත්පාදනය කිරීම සඳහා ඔබ විසින් අදහස් කරන්නේ නම් ඉඩම් පිහිටි ස්ථානයන් හා අනෙකුත් කොන්දේසි සම්බන්ධ තොරතුරු පහත සඳහන් කාර්යාලවල දී ලබාගත හැක.

01. අංක 500, ටී.බී ජයා මාවත, කොළඹ 10 (3 වෙනි මහල, තාක්ෂණ සේවා අංශය) දුරකථන අංකය 011- 2696436.

02. අංක 11, ජාවත්ත පාර, කොළඹ 05 (විදුලි හා යාන්ත්‍රික අංශය) දුරකථන අංකය 011 - 2505675.

මීට අමතරව, මෙම තොරතුරු www.mahaweli.gov.lk ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වෙබ් අඩවියෙන්ද ලබාගත හැක.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය